**සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කනේවෙල අමුණ ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ මිලදීගෙන තිබුණු යකඩ කම්බි සහ යකඩ ගේට්ටු තොගය එම කොන්ත්‍රාත්තුව නතර කිරීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමට පත්වෙමින් පැවතුණි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ 13.4 ඡේදය ප්‍රකාරව තොගයේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව පිරිවැය වූ රු.1,412,685 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කනේවෙල අමුණ ඉදිකිරීම වෙනුවෙන් මිලදී ගත් යකඩ කම්බි සහ යකඩ ගේට්ටු වත්කම් ලෙස ගිණුම්ගත කිරීමේදී පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට ගිණුම්ගත කර අවසන් තොගය වත්කම් ලෙස ගිණුම්ගත කර ඇත. තවද යකඩ කම්බි ආයතනයේ කන්ටේනරයේ බහා මලකඩ කෑම අවම වන ලෙස සුරක්ෂිතව අසුරා ඇත. මේ වනවිට මෙම යකඩ කම්බි හා ගේට්ටු මිලදී ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කැමැත්ත ප්‍රකාශ කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ 17.19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාගම සතු පිරිවැය රු.3,587,095 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 40 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ප්‍රමිතිගතකරණය අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කොට පොත්වලට ඇතුළත් කිරීමට 2022 මූල්‍ය වර්ෂයේ සිට අවශ්‍ය කටයුතු කිරීමට කළමනාකාරීත්වය උපදෙස් දී ඇත. | -එම- |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ දෙවන වගන්තිය අනුව එකතු කළ අගය මත බදු පැනවීම සිදුකළ හැක්කේ ලියාපදිංචි තැනැත්තෙකු විසින් පමණක් වන අතර සමාගමද බදු ලියාපදිංචි ආයතනයක් වශයෙන් 2021 මාර්තු 02 දින එකතු කළ අගය මත බදු ඉන්වොයිසියක් යටතේ රු.131,580 ක් පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතියෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2020 සැප්තැම්බර් මස සිට සමාගම බදු නිදහස් ආයතනයක් බවට පත්ව තිබුණු අතර එම අයකරගත් බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම හෝ ව්‍යාපෘතියට ආපසු ලබා දීමක් සිදු නොකර සමාගමේ ආදායමට බැර කර තිබුණි | මහවැලි උපදේශක සේවා කාර්යාංශ සමාගම බදු ලියාපදිංචි ආයතනයකි. පහළ මල්වතුඔය ජලාශය වෙනුවෙන් අප ආයතනය ගිවිසුම් ගතවී ඇත්තේ 2013 වර්ෂයේදී ය. ගිවිසුම් ගතවී ඇත්තේ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ යන බදු දෙවර්ගයම ලියාපදිංචි තැනැත්තෙකු විසින් අයකර එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් ගෙවීමට යටත්වේ. නමුත් රජයේ බදු ප්‍රතිපත්ති හා අගයන් කලින් කලට වෙනස් වේ. මේ අනුව 2020 සැප්තැම්බර් මස සිට ගෙවිය යුතු බදු සීමාව හා බදු ප්‍රතිශතය රජය විසින් වෙනස් කරන ලදී. නමුත් ගිවිසුම් ප්‍රකාරව මෙය අවසාන ලැබිය යුතු ඉන්වොයිසිය වන අතර, ගිවිසුමේ ආකාරයට අයකර ගැනීමට අපහටද හේතු විය. මෙම අයකර ගත් බදු ප්‍රමාණය රජයේ බදු ප්‍රතිපත්ති තීරණ මත ගෙවිය යුතු සීමාව ඉහළ දැමීම හේතුකොට ගෙන අප ආයතනය ගෙවිය යුතු බදු නිදහස් විය. ඒ හේතුව මත අයකර ගත් බදු ප්‍රමාණය පවත්නා වර්ෂයේ ආදායමට ගලපන ලදී. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 5 ඉක්මවූ රු.4,660,851 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් 8 ක් සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවුණි. මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇති රු.1,319,471 අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. වෙලි ආරක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.442,647 ක් එම ව්‍යාපෘතිය අවසන්වී ඇති බැවින් අයකර ගැනීම ප්‍රශ්න සහගතවී තිබුණි. | සියලුම ලැබිය යුතු ශේෂ සනාථ කිරීම සඳහා 2022/02/08 වැනි දින ශේෂ සනාථ කිරීමේ ලිපි යවා ඇත. කළමනාකාරීත්වයේ උපදෙස් අනුව කටයුතු කර මෙම ශේෂයන්ගෙන් 2022 මැයි මස වන විට රු.1,960,961 ලබාදීමට එකඟතාවය පලකර ඇති අතර, ඉතිරි ශේෂ ලබාගැනීමට කටයුතු කරමින් සිටී. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළයුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට රු.6,793,076 ක් වූ ගෙවිය යුතු ශේෂයෙන් රු.3,599,310 ක් අවුරුදු 05 කට වැඩි ශේෂයක් වූ අතර නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | වසර 5කට වැඩි කාලයක් නිරවුල් නොවූ ශේෂයන්ගෙන් රු.3,115,071 ක් ගිංනිල්වලා ව්‍යාපෘතිය වෙනුවෙන් ලද අත්තිකාරම් වන අතර ව්‍යාපෘතියේ වැඩ අවසන්වී නොමැත. ඉතිරි රු.318,200 ද යාන්ඔය ව්‍යාපෘතියේ අත්තිකාරම් ගෙවීම් වන අතර, එම ව්‍යාපෘතියද වැඩ නිමවී නොමැත. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,284,205 පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.13,924,210 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,640,005 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම 2022 ජුනි 21 දින විගණනයට ඉදිරිපත් කලද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. ව්‍යාපෘති 04 ක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම හා ව්‍යාපෘති 02 ක සමාජ ආර්ථික සමීක්ෂණය හා නැවත පදිංචිය සඳහා සැලසුම් සකස් කිරීම 2021 වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් බව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණද, එම අපේක්ෂිත කාර්යයන් යටතේ සේවාලාභියා වෙත ඉදිරිපත් කළයුතු වාර්තා ඉදිරිපත් කළයුතු කාලසීමාවන් පිළිබඳ තොරතුරු, බාහිර පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබාගතයුතු අවස්ථාවලදී ඒවා ලබාගැනීමට අපේක්ෂිත කාලසීමාවන්, වාර්තාවල පරිවර්තන ලබාදියයුතු කාලසීමාවන්, උපදේශන සේවා ලබාදෙන නිලධාරීන්ට ගෙවීම් කළයුතු කාලසීමාවන් හා කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් මුදල් අයකර ගැනීමට අපේක්ෂිත කාලසීමාවන් පිළිබඳ විස්තර එහි ඇතුළත් වියයුතු වුවද, ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ එම තොරතුරු ඇතුළත් කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරන අංශය හෝ නිලධාරියා පැහැදිලිව සඳහන් කළයුතු වුවද, එසේ කර නොතිබුණි. | 2021 වර්ෂයේ අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන ඇතුළත් ප්‍රසම්පාදන සැලැස්ම යන දෙකම පිළියෙල කර ඇත. පසුගිය වර්ෂ කිපයම රටේ පවතින කොරෝනා වසංගත තත්ත්වය නිසා අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමේ අස්ථාවර තත්ත්වයන් පැවතීම මීට හේතු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව අදාළ සැලසුම් පිළියෙල කළයුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ ඉංජිනේරු අංශය විසින් 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා කිසිදු නව මෙහෙයුම් කටයුත්තක් භාරගෙන නොතිබුණ අතර, ව්‍යාපෘති කළමනාකරණ අංශය විසින් 2021 වර්ෂයේදී එක් මෙහෙයුම් කටයුත්තක් භාරගෙන තිබුණි. ව්‍යාපෘති 02 ක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම මඟින් රු.2,789,200 ක්ද, ඉදිකිරීම් කටයුතුවලින් රු.6,737,384 ලෙස රු.9,526,584 ක මෙහෙයුම් ආදායමක් සහ රු.2,417,880 ක ස්ථාවර තැන්පතු පොලියක් සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබුණද, සමාගම මෙම වර්ෂයේදී ද රු.7,284,205 ක අලාභයක් ලබාගෙන තිබුණි | මෙම සමාගම ඈවර කිරීමට තීරණය කිරීම හේතුවෙන් 2019 හා 2020 වර්ෂවල නව මෙහෙයුම් භාරගෙන නොතිබීම හා වර්ෂ ගණනාවක සිට ඉංජිනේරු අංශය නොකඩවා අලාභ ලැබීම මත හා කළමනාකරණයේ ප්‍රතිපත්තිමය තීරණය මත 2021 වර්ෂයේ සිට ඉංජිනේරු අංශයේ මෙහෙයුම් නවතා දමන ලදී. 2021 වර්ෂයේ සමාගම රු.9,526,584 ක මෙහෙයුම් ආදායමක් හා රු.2,417,880 ක ස්ථාවර තැන්පතු පොලී ආදායමක් ලැබුවද, ඊට සාපේක්ෂව ආයතනයේ මෙහෙයුම් වියදම් රු.19,229,364 ක් වාර්තා කිරීම නිසා පවත්නා වර්ෂයේ රු.7,284,205 අලාභයක් ලබාගෙන ඇත. තවද, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩු අගයක් ගෙන තිබේ. | ආයතනික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පියවර ගතයුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබා දීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට රු.20,200,000 පාඩුවක් සිදුව තිබුණි. 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කොට මාසයක් තුළ කාරක සභාව වෙත වාර්තා කළයුතු බව නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් කර නොතිබුණු අතර, නීතිමය පියවර ගැනීම සඳහා 2020 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර තිබුණි. | මේ වනවිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කළ බවට නිරීක්ෂණය වන සභාපතිවරයා මිය ගොස් ඇති බැවින්, එම මුදල අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටී. ඒ වෙනුවෙන් නීතිපති අංශයේ උපදෙස් හා නීති ක්‍රියාමාර්ග සම්බන්ධව ඉල්ලුම් කර ඇත. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර බඳවාගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ කාර්යමණ්ඩලය සඳහා බඳවාගැනීම්, උසස්කිරීම්, තනතුරුවලට අදාළ සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය. | සමාගම ඈවර කිරීමට ගෙන තිබූ තීරණය හේතුවෙන් 2018 වර්ෂයේ සිට සමාගමේ මෙතෙක් කරගෙන ගිය ව්‍යාපෘති නතර කිරීමට සහ කාර්යමණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, වැටුප් වර්ධක අත්හිටුවීම් මත සමාගම සඳහා නිශ්චිත කාර්යමණ්ඩලයක් හා ඊට අදාළව බඳවා ගැනීමේ කාර්යපටිපාටිය සම්බන්ධ කටයුතු සිදුකිරීමට නොහැකි තත්ත්වයකට පත්විය. 2021 වර්ෂයේ නව කළමනාකාරීත්වය යටතේ ආයතනයට ලැබෙන නව ව්‍යාපෘති සලකා බලා ඒ මත ආයතනික ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සලකා බලමින් සිටී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවාගැනීම් සිදුකර ආයතන කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන උපදේශක සේවා ක්‍රියාත්මක කිරීමට අදාළ කළමනාකාර (ව්‍යාපෘති) තනතුර සහ ඉංජිනේරු අංශයේ ඉංජිනේරු තනතුර 2019 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතියද 2022 ජූනි දක්වා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමට ගෙන තිබූ තීරණය හේතුවෙන් 2018 වර්ෂයේ සිට සමාගමේ මෙතෙක් කරගෙන ගිය ව්‍යාපෘති නතර කිරීමට සිදුවිය. එම නිසා අදාළ තනතුරුවලට නිලධාරීන් පත් කළ නොහැකි වේ. | -එම- |